සියලු ම හිමිකම් ඇවිරිණි/
முழுப் பதிப்புரிமையுடையது/
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் /
Department of Examinations, Sri Lanka

| ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| එකතුව | |
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

# ශ්‍රී ලංකා මහ බැංකුවේ මාණ්ඩලික නොවන පන්තියේ සේවා නියුක්තිකයන් සඳහා මාණ්ඩලික පන්තියේ I වන ශ්‍රේණියට, කඩිනම් උසස්වීම් පටිපාටිය යටතේ උසස් කිරීම සඳහා වන සීමිත තරග විභාගය - 2018

## (01) විශ්ලේෂණාත්මක ලිවීම

පැය දෙකයි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න. විභාග අංකය :......................

**1.** පහත දැක්වෙන පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

> විදේශීය අංශයේ ස්ථායිතාව ඇති කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන යෝග්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් විදේශීය අංශයේ ඉදිරි දැක්ම මැදි කාලයේ දී ක්‍රමයෙන් වැඩිදියුණු වනු ඇතැයි පුරෝකථනය කෙරේ. විදේශීය අංශයේ පුරෝකථනය කරන ලද වර්ධනයත් සමග ගෙවුම් තුලනයේ ජංගම ගිණුමේ හිඟය ක්‍රමයෙන් අඩු වෙතැයි අපේක්ෂා කෙරේ. ආනයනවලට වඩා වැඩි වේගයකින් අපනයන වැඩි වෙතැයි පුරෝකථනය කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මැදි කාලයේ දී වෙළඳ හිඟය අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. වරණීය වෙළඳ ගිවිසුම් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) යටතේ වන සහන නැවත ලබා ගැනීම ඇතුළු වෙළඳ සම්බන්ධතා වර්ධනය කර ගැනීම සහ යෝජිත ආර්ථික සහයෝගිතා ගිවිසුම් හේතුවෙන් අපනයනාභිමුඛ දේශීය නිෂ්පාදන වර්ධනය කර ගැනීමෙන් අපනයන වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කෙරේ. ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර ඛනිජ තෙල් මිල ගණන්වල අපේක්ෂිත ඉහළ යෑමත් සමග අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම සහ පුරෝකථනය කළ ආයෝජන වියදම් ඉහළ යෑම හේතුවෙන් ආයෝජන භාණ්ඩ සඳහා වන ඉල්ලුම වැඩි වීම හේතුවෙන් ආනයන වියදම ද අඛණ්ඩ ව ඉහළ යනු ඇත.

*(ලකුණු 05 × 5 = 25 යි)*

(i) ආනයන වියදම අඛණ්ඩ ව ඉහළ යනු ඇතැයි මේ ලේඛකයා පවසන්නේ කවර හේතුවක් නිසා ද?

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

(ii) මැදි කාලයේ දී වෙළඳ හිඟය අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරෙන්නේ කවර සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් ද?

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

[2 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

(iii) ගෙවුම් තුලනයේ ජංගම ගිණුමේ හිඟය ක්‍රමයෙන් අඩු වෙතැයි බලාපොරොත්තු වන්නේ කවර සිදුවීමක් හා සමගාමී ව ද?

............................................................................................................

............................................................................................................

............................................................................................................

............................................................................................................

............................................................................................................

(iv) අපනයන වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කෙරෙන්නේ කෙබඳු ආකාරයෙන් ද?

............................................................................................................

............................................................................................................

............................................................................................................

............................................................................................................

............................................................................................................

(v) ජාත්‍යන්තර ඛනිජ තෙල් මිල ගණන්වල අපේක්ෂිත ඉහළ යාමට සමාන්තර ව සිදු වූ විපර්යාසය කුමක් ද?

............................................................................................................

............................................................................................................

............................................................................................................

............................................................................................................

............................................................................................................

**2.** ශ්‍රී ලංකාවේ පළාත්වල 2012/2013 වසරවල ආලෝකය ලබා ගන්නා ආකාරය ප්‍රතිශතයක් ලෙස පහත සඳහන් වගුවේ දක්වා ඇත. වගුවේ ඇති මූලික දත්ත අදාළ පරිදි සසඳමින් වචන **150**කට නොවැඩි වන සේ වාර්තාවක් ලියන්න.

*(ලකුණු 25 යි)*

| ආලෝකය ලබාගන්නා ප්‍රධාන ආකාරය / පළාත | විදුලිය (%) | භූමිතෙල් (%) | සූර්ය බලය (%) | වෙනත් (%) |
|---|---|---|---|---|
| බස්නාහිර | 97.6 | 2.2 | 0.2 | – |
| මධ්‍යම | 92.5 | 7.1 | 0.4 | – |
| දකුණ | 94.4 | 5.2 | 0.3 | 0.1 |
| උතුර | 66.0 | 31.9 | 2.0 | 0.1 |
| නැගෙනහිර | 79.9 | 19.6 | 0.5 | – |
| වයඹ | 89.1 | 9.4 | 1.5 | – |
| උතුරු මැද | 87.4 | 11.1 | 1.0 | 0.5 |
| ඌව | 83.7 | 14.1 | 2.0 | 0.2 |
| සබරගමුව | 88.2 | 11.0 | 0.8 | – |

[3 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

විභාග අංකය :........................

Department of Examinations Sri Lanka ,
Department of Examinations Sri Lanka ,

[4 වැනි පිටුව බලන්න.

**3.** පහත දී ඇති පාඨය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක්** වනසේ සාරාංශ කොට ලියා, ඊට සුදුසු **මාතෘකාවක්** ද යොදන්න. සාරාංශයේ අග ඔබ යෙදූ **වචන සංඛ්‍යාව** සඳහන් කරන්න.

> අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවය ගුරුවරුන්ගේ ගුණාත්මකභාවය මත රැඳී පවතින බැවින් නිපුණතා සහිත උපාධිධාරීන් අතර ගුරු වෘත්තිය ජනප්‍රිය කරවීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් දිගුකාලීන උපායමාර්ග සැකසීම අත්‍යවශ්‍ය වේ. මනා අධ්‍යාපනයක් ලබා දීමෙහි ලා පාසල්වල සාර්ථකත්වය තීරණය කිරීම සඳහා විදුහල්පතිවරුන්ගේ ගුණාත්මකභාවය බොහෝ දුරට වැදගත් වන බව ජාත්‍යන්තර පර්යේෂණ මගින් හෙළි වී ඇත. එම නිසා, විදුහල්පතිවරුන්ගේ ගුණාත්මක භාවය නැංවීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතු ය. ඊට අමතර ව, නිදහස් අධ්‍යාපන පහසුකම ලබා දෙනු ලැබුව ද ඉහළ ආදායම් ලාභීන්ට වඩා දිළිඳු ආර්ථික පසුබිමක් සහිත පුද්ගලයන් අධ්‍යාපනය ලබන වසර ගණන අඩු අතර, ග්‍රාමීය පළාත්වල ජීවත් වන ජනතාව හා දුගී ජනතාව ලබන අධ්‍යාපනයෙහි සහ පුහුණුවෙහි සැලකිය යුතු විෂමතාවක් පෙන්නුම් කරමින්, එවැනි ප්‍රදේශවල ජීවත් වන පුද්ගලයන් විසින් ලබන අධ්‍යාපනයේ ගුණාත්මකභාවය පහළ මට්ටමක පවතින බව අධ්‍යයන මගින් අනාවරණය වී ඇත. තවද, රජයේ පාසල් මගින් සේවා සැපයීමේ අසමානතාව හේතු කොට ගෙන ජනප්‍රිය පාසල් සඳහා ඉහළ ඉල්ලුමක් පවතින අතර, අනෙකුත් පාසල් ඌන උපයෝජනයකට ලක් වී ඇත. ජනප්‍රිය නොවන්නේ යැයි සැලකෙන පාසල් ඉලක්ක කරගෙන ඒවායෙහි තත්ත්වය හා ආකර්ෂණීයත්වය ප්‍රවර්ධනය සඳහා ගෙන ඇති මෑතකාලීන රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රශංසනීය වන අතර, එවැනි ප්‍රතිපත්තිවල සාර්ථකත්වය ඉදිරියේ දී දැක ගැනීමට හැකි වනු ඇත. තවද නගර ආශ්‍රිත පාසල් උදෙසා ඉහළ යන ඉල්ලුම සපුරා ලීම සඳහා පෞද්ගලික පාසල්වල දායකත්වය ලබා ගැනීමට පහසුකම් සැපයිය යුතු අතර, එම පාසල්වලින් බහුතරයක් නියාමන රාමුවකට යටත් නොවන හෙයින් එම සේවා සැපයුමේ ප්‍රමිතිය සහ ඒකීයත්වය සහතික කිරීම ද අවශ්‍ය වේ.

*(ලකුණු 20 යි)*



Department of Examinations Sri Lanka

**4.** පහත දී ඇති විස්තරය කියවා, එහි අන්තර්ගතයට අදාළ වන සේ විශ්ලේෂණාත්මක හා විචාරාත්මක රචනයක් ලියන්න. වචන සීමාව **250 - 300** අතර විය යුතු ය. රචනයට ගැළපෙන මාතෘකාවක් ද යොදන්න.

සංවර්ධනය වෙමින් පවත්නා රටවලට සංවර්ධිත රටවලින් වරින්වර ආධාර සපයනු ලැබේ. මේ ආධාර බොහෝ විට මූල්‍යමය ප්‍රතිදාන වශයෙන් ලබා ගැනීමේ ප්‍රවණතාවක් පවතී. එම මූල්‍යමය ප්‍රතිදාන මූලික සැලසුම් කාර්ය සඳහා යෙදවීම හේතුවෙන් ආධාරවලින් අපේක්ෂිත ප්‍රතිඵලය නොලැබී යන අවස්ථා සුලභ ය. එබැවින් සංවර්ධන ව්‍යාපෘති සඳහා විදේශ ආධාර ලබා ගැනීමේ දී මූල්‍යමය ප්‍රතිදාන වශයෙන් නොව යන්ත්‍ර සූත්‍ර, උපදේශනය හා පුහුණුව වශයෙන් මෙම ආධාර ලබා ගැනීම වඩාත් ප්‍රතිඵලදායක බව කිව යුතු ය.

*(ලකුණු 30 යි)*



Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

* * *

Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka